# UNIVERSITY OF PERADENIYA

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර – නව නිර්දේශය-පරීක්ෂණය 300 මට්ටම – පෙබරවාරි 2022
கலைத்தேர்வுப் பரீட்சை) வெளிவாரி-புதிய பாடத்திட்டம் (300 வது தேர்ச்சி மட்டம் – பெப்ரவரி 2022
**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level – February - 2022**

**(ECNE 301: Sri Lankan Economy)**

කාලය පැය (03) තුනයි
**(மூன்று) 03) மணித்தியாலங்கள்**
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ
**எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.**
Marks will be deducted for illegible hand writing.

ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්නග
**05 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.**
Answer any 05 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි
**இந்த வினாப்பத்திரத்தில் 10 வினாக்கள் உள்ளன.**
There are 10 questions in the question paper.

---

1. i. ආර්ථික වෘධියෙහි ප්‍රධාන මූලාශ්‍රයන් මොනවාද? (ලකුණු 05)

   ii. නිදහසින් පසු කාලසීමාවේදී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අත්දැකීමට සිදුවූ ප්‍රධාන බාධකයන් සුදුසු දර්ශක භාවිතා කරමින් සාකච්ඡා කරන්න. එම බාධකයන් ජය ගැනීම සඳහා පිළියම් ලෙස අනුගමනය කලහැකි ක්‍රියාමාර්ග කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. i. ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ විවිධ අධියරයන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

   ii. වර්ෂ 1960 ගණන් වල සිට ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයේ අඩුවීමක් සඳහා දායකවූ ප්‍රධාන සමාජ ආර්ථික සාධක මොනවාද? (ලකුණු 05)

   iii. ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයේ ආර්ථික ප්‍රතිවිපාක මෙරට ආර්ථික සංවර්ධනය මත සිදුකරන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

3. i. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙහි මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05)

   ii. වර්ෂ 1970 ගණන් වල සිට දුප්පත්කම පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කල වැඩසටහන් වල කාර්ය සාධනය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩුකරගැනීමට පවත්නා වැඩසටහන් සඳහා කුමන ප්‍රතිසංස්කරන ඔබ යෝජනා කරන්නේද? (ලකුණු 15)

4. i. ෆිස්කල් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රතිපත්ති අතර වෙනස හඳුන්වන්න. (ලකුණු 05)

   ii. වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

   iii. ෆිස්කල් කළමනාකරණයෙහි වැදගත් ඇඟවීම් සහ රාජ්‍ය වියදම් මූල්‍යනය සඳහා ඉහළ මට්ටමක රාජ්‍ය ණය පවත්වා ගැනීමේ ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. i. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් මොනවාද? (ලකුණු 05)

   ii. උද්ධමනයෙහි පිරිවැය පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iii. උද්ධමනය සහ සේවා වියුක්තිය අතර පැවතිය හැකි ආනුභවික (empirical) සම්බන්ධතාවය සාකච්ඡා කරන්න (ලකුණු 05)

   iv. "මහජනතාව උද්ධමනයට වඩා වැඩි වශයෙන් පීඩාවට පත්වන්නේ සේවා වියුක්තියෙනි." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර සඳහා හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05)

6. i. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අරමුණු මොනවාද? (ලකුණු 05)

   ii. ආහාර සුරක්ෂිතතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව ලඟාකර ගැනීම සඳහා වන ප්‍රධාන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 05)

   iii. ශ්‍රී ලංකාවේ කෘෂි අංශයේ ප්‍රධාන ගැටළු කෙටියෙන් දක්වන්න. මෙම ගැටළු විසඳගැනීම සඳහා මෑතකාලීනව රජය විසින් අනුගමනය කල ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 10)

7. i. අයවැය හිඟය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථිකය මත සිදුකරන බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

ii. ශ්‍රී ලංකාවේ අයවැය හිඟය මූල්‍යනයට රාජ්‍ය ආදයම ප්‍රමාණවත් නොවීම සඳහා ප්‍රධාන හේතු දක්වන්න. (ලකුණු 07)

iii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් නොකඩවා ඉහලයාම සඳහා හේතු මොනවාද? (ලකුණු 06)

8. බුද්ධි ගලන සංසිද්ධි සහ ඌන සේවා නියුක්ත ශ්‍රමය ශ්‍රී ලංකා ශ්‍රම වෙළෙඳපොළ ස්ථාවරත්වය සහ එහි නව්‍යකරණ අනාගතය මත තීරණාත්මක ලෙස බලපායි. ශ්‍රී ලංකාවේ සමකාලීන තරුණ සේවා වියුක්තිය හා සම්බන්ධව මෙම තත්වය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

9. i. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි වර්තන ගිණුම සාමාන්‍යයෙන් හිඟයකින් යුක්ත වන්නේ ඇයිද යන්න හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය පැහැදිලි කිරීමෙහිලා පහත දැක්වෙන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරන කොතරම් වැදගත්වේද? වත්මන් ආර්ථික ගැටළු සැලකිල්ලට ගනිමින් භාහිර මූල්‍යනය හා සම්බන්ධව ඒවාට සුදුසු ප්‍රතිපත්ති නිර්දේශයන් සහ සාධාරණීකරණයන් ඉදිරිපත් කරන්න.

(a) විදේශ විනිමය අනුපාත කළමනාකරණය
(b) අපනයන විවිධාංගීකරණය
(c) ආනයන තීරු බදු ප්‍රතිපත්තිය (ලකුණු 12)

10. කොවිඩ්-19 වසංගත තත්වය ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය, ආදායම, ශ්‍රම වෙළෙඳපොළ සහ රාජ්‍ය මූල්‍ය මත ඇතිකල බලපෑම විභාගකර ඇගයීමක් කරන්න. (ලකුණු 20)

****************************************